


# Look ! I got flowers
# බලන්න! මට මල්පොකුරක්



We had our first argument last night, and he said a lot of cruel things that really hurt me. I know he is sorry and didn't mean the things he said, because he sent me flowers today.

I got flowers today. It wasn't our anniversary or any other special day.

Last night he threw me into a wall and started to choke me. It seemed like a nightmare, I couldn't believe it was real. I woke up this morning sore and bruised all over. I know he must be sorry, cause, he sent me flowers today.

I got flowers today, and it wasn't mother's day or any other special day

Last night, he beat me up again, it was much worse than all the other times. If I leave him, what would I do? How would I take care of my kids? What about money? I'm afraid of him and scared to leave. But I know he must be sorry, because he sent me flowers today.

I got a lot of flowers today. Today was a very special day. It was the day of my funeral. Last night, he finally killed me. He beat me to death. If only I had gathered enough courage to leave him, I would not have gotten flowers today.......!

**When cold-hearted men around**
**In you dear flower solace I found**
**No warmth but plenty tears instead**
**What flowers when I'm finally dead?**

ඊයේ රැයේ අපේ මුල්ම බහින්බස්වීම ඇතිවිය. මගේ සිත තදින් රිදෙන ඉතා අකාරුණික දේවල් කියමින් ඔහු මට බැන්නේය.

එහෙත් ඔහු ඒ කිසිවක් සිතාමතා කී දේ නොවන බවත්, එසේ කීම ගැන ඔහු කණගාටුවන බවත්, පසුතැවිලි වන බවත් මට වැටහිණ. මන්ද ඔහු මට අද උදෑසනම ඉතා පියකරු මල් පොකුරක් එවා තිබුණ නිසාය.

අද මට මල් පොකුරක් ලැබිණ. එය අපේ විවාහයේ සංවත්සරය හෝ වෙනත් විශේෂ දිනයක් ද හෝ නොවේ.

ඊයේ රාත්‍රි ඔහු මා වැරෙන් තල්ලු කළේය. මා විසිවී ගොස් බිත්තියේ හැපුණි. ඒ සමගම ඔහු මගේ බෙල්ල හිර කළේ ය. හුස්ම ගන්නට බැරිව මම දැහැලුවෙමි. එය භයානක සිහිනයක් දකිනවා වැනිය. හැබැහින් වන දෙයක් යයි මට සිතාගන්නටවත් බැරි විය.

අද උදේ මා ඇහැරුණේ ඉතා රිදුම් දෙන බෙල්ල හා ඔළුව පමණක් නොව සිරුර පුරා සීරුණු ඉදිමුණු තැන් ද ඇතිව ය. නමුත් ඒ වූදේ ගැන ඔහු දුක්වන, කණගාටුවන බව මම දනිමි. මක්නිසාද, අද ඔහු මට ලස්සන මල් පොකුරක් එවා තිබූ නිසා ය.

අද උදෑසනම මට මල් පොකුරක් ලැබිණ. කොතරම් සුන්දරද? එය අම්මාවරුන්ගේ දිනය හෝ වෙනත් විශේෂ දිනයක්ද හෝ නොවී ය.

ඊයේ රැයේ ඔහු මට නොසෑහෙනසේ තැළුවේය. ඊට පෙර කිසිම වතාවකටත් වඩා එය ඉතා දරුණුවිය. මට ඔහු අත්හැර යන්නටද නොහැකිය. එසේ කරන්නට ඔහු ඉඩ නොදෙනු නිසැකය. මින් පිටවී ගියත් මා ඉන්පසු කුමක් කරන්නද? මගේ දරුවන් ගැන බලන්නේ කවුද? අනෙක මට මුදල් කෝ? මට ඔහු ගැන ඇත්තේ දැඩි බයකි. ඒ නිසාම ඔහු හැර යන්නට සිතක් නොදේ. නමුත් ඒ සමගම යළිත් මට හැඟුණේ ඔහු මට පහරදීම ගැන දුක්වන, පසුතැවිලි වන බවය. මක්නිසාද, ඔහු මට මල් පොකුරක් ගෙනැවිත් දීමෙන් එය හැඟවූ බැවිනි.

අද මල් පොකුරු ගොඩාක් ලැබිණ. ඇත්ත වශයෙන්ම අද මට ඉතා විශේෂ දිනයකි. එනම් අද මගේ අවමඟුල් දිනයයි. අවසානයේ ඊයේ රාත්‍රියේ ඔහු මා මරාදැමුවේය. මැරෙනතුරු ඔහු මට පහර දුන්නේය. ඔහුගෙන් මිදී යන්නට ධෛර්‍යය බිඳක් හෝ අනේ ! මට තිබුණේ නම් මෙලෙස මට මල්පොකුරු අද ලැබෙන්නේ නැත.

**හිත තුළ තෙතක් නැති මිනිසුන් සිටින කල**
**සැනසුම නුඹ පමණි විහිදන සුවඳ මල**
**දින දින කඳුළු පමණකි ඇස එකතු කළ**
**කුමටද ලැබී මල් පොකුරක් මැරුණු කල?**

♦ **දීපා සඳමාලි හේරත්**
**Deepa Sandamali Herath**
**USA**





# දඹුල්ලේ බස් පිපිරුම්

අනුරාධපුර රුවන් මැලි සෑයේ නෙළුම් මල් පූජාවට යමින් සිටි අහිංසක බැතිමතුන් 18 දෙනෙකුට මරු කැඳවමින් පසුගිය 2 වෙනි දින උදෑසන දඹුල්ල නගරය මධ්‍යයේ පිපිරී ගිය අධිබලැති කාල බෝම්බය බස් රථයේ ඇටවූ කොටි ත්‍රස්තවාදියා නාවුල ප්‍රදේශයෙ දී ඉන් බැසගොස් ඇත්තේ කොන් දොස්තරවරයාට සිනාසී අතවනා ටටා කියමින් බව පරීක්ෂණයේදී හෙළි වී ඇත.

කොන්දොස්තර කියන අන්දමට කොටි ත්‍රස්ත වාදියා-යයි සැක කරන පුද්ගලයා බසයට නැග ඇත්තේ මාතලේදීය. තමාට ඔහු ගැන සැකයක් ඇතිවූ නමුත් පොලීසිය ලවා පරීක්ෂාකරවන්නට නොසිතූ බවත් කොන් දොස්තර කියා ඇත.

මියගිය අය අතර කාන්තාවන් 16 දෙනෙකි. කුඩා දරු-වන් 5 දෙනෙක් ඇතුළු මගීන් 75 දෙනෙක් බරපතල තුවාල ලැබූහ. මියගිය පවුල් වලට රුපියල් ලක්ෂය බැගින් ද, තුවාල ලැබූ අයට රුපියල් පණස් දහස බැගින්ද, අවසන් කටයුතු කිරීම සඳහා තවත් රුපියල් පහළොස් දහස බැගින්ද ගෙවීමට රජය කටයුතු කර ඇත.

ඉහත පින්තූර වලින් දැක්වෙන්නේ පිපිරුමෙන් මුළුමනින්ම විනාස වී ඇති බස්රිය හා ජනතාව එකතු වී තුවාලකරුවන් බසයේ සුන්බුන් අතරින් එළියට ගන්නා ආකාරයයි

**සටහන - සරත් එරමිණිගම්මන - සීගිරිය**